**ශීර්ෂය 123 - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 123 - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 24 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 7,803.08 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,732.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 70.64 ක් හෙවත් සියයට 0.9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,208.33 | 1,176.31 | 32.02 | 2.6 |
| මූලධන | 6,594.75 | 6,556.13 | 38.62 | 0.6 |
| එකතුව | 7,803.08 | 7,732.44 | 70.64 | 0.9 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 12301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.00 | 9.80 | 4.00 | 5.78 | 75.00 | 26.42 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන අංක 6000/0000/00/0013/0071/000 දරන තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.17 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| | **මුදල් රෙගුලාසි 94** | 1,471,160 | වැය විෂයයන් 08 ක ප්‍රතිපාදන මුදල් ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි. |
| (ආ) | **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| | 2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/2015 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 1,718,087 | චක්‍රලේඛය පරිදි අනිවාර්ය ඉතිරි කිරීම් කර නොතිබුණි. |

**3.3 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2016 දෙසැම්බර් 31 දින වනවිට වියදම | භෞතික ප්‍රගතිය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | | | රු.මිලියන | % | |
| ආදර්ශ ගම්මාන වැඩසටහන | 1,125 | 2016.01.16 | 2016.12.31 | 1,079 | 6 | යෝග්‍ය ඉඩම් හඳුනා ගැනීම, මැනුම් කටයුතු හා අදාළ අනුමැතින් ලබා ගැනීම වැනි මූලික කටයුතු සඳහා වැඩි කාලයක් ගතවීම. |
| වැලිඔය නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය | 350 | 2016 පෙබරවාරි | 2016.12.15 | 311 | 4 | මූලික කටයුතු සඳහා වැඩි කාලයක් ගතවීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විසිරි නිවාස වැඩසටහන | 3,704.05 | 2016.01.30 | 2016.12.25 | 3,785 | 69 | ප්‍රතිලාභීන් තේරීම සඳහා වැඩි කාලයක් ගතවීම. |
| පැරණි නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම | 240 | 2016.01.01 | 2016.12.30 | 240 | 33 | කොන්ත්‍රාත් අවලංගු කර නව කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දීම සඳහා වැඩි කාලයක් ගතවීම. |

**3.4 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති බව නිරීක්ෂණය විය.

(i) කිරුළපන නුගගහපුර ව්‍යාපෘතිය
(ii) මධ්‍ය ආදායම්ලාභීන්ගේ නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 20 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 109 | 86 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 47 | 06 |
| | **එකතුව** | **193** | **155** | **38** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පුරප්පාඩු 38 ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ දී මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ප්‍රමාණවත් කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යන ආයතනවලින් වැටුප් ගෙවනු ලබන නිලධාරීන් 27 දෙනෙකු 2007 දෙසැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලය තුළ වරින් වර අමාත්‍යාංශයේ රාජකාරී කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි.